Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2024), Vol. 09, IRCHSS 2023-Special Issue

# A Comparative Study of Variations in Old and Modern Sinhala Travel Narratives (With Selected Travel Narratives)

Y. I. S. Jayasena

Department of Sinhala, University of Peradeniya, Sri Lanka

**Article Info**

Article History:
Received 23 Aug 2023
Accepted 27 Oct 2024
Issue Published Online
01 April 2024

**Key Words:**
Travelogue
Modern
Ancient
Narratives
Variations

*Corresponding author
E-mail address:
iwanthasanduni@gmail.com

https://orcid.org/0009-0001-2670-655X

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v09irchss2023.a07

VJHSS (2024), Vol. 09 (IRCHSS 2023-Special Issue), pp. 83-91

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY

Faculty of Humanities and Social Sciences 2024

## ABSTRACT

*Among the types of narratives, travel narratives are unique reports. Travel writing, which is also known by synonyms such as travel stories, travel notes, travel reports, etc., is also known as Travel Writing. Travelers around the world have written many travelogues with the aim of sharing their experiences. "Are there differences between old Sinhala travel narratives and modern Sinhala travel narratives?" This is the research problem of this research. The primary objective of the research was to identify the differences between old Sinhala travel narratives and modern Sinhala travel narratives. A secondary objective was to identify ancient and modern Sinhala travel narratives. There, the data collected through qualitative research methodology was analyzed using the descriptive method. A special feature that can be seen in local travel narratives is the information of  described in those reports; To see narrowly and optimistically. Also, many of the early Sinhala travelogues were written about Indian aid. In this research, it was possible to identify the variations that were not seen in the old and modern Sinhala travel narratives, both in terms of language and content. Especially in the use of language, differences could be identified along the lines of syntax, spelling, wording and decorative use. Although there are variations in the old and modern Sinhala travel narratives, it can be concluded that there are some similarities. As well as social evolution towards variation among travel narratives language evolution has also been a strong reason.*

**මාතෘකාව**

පැරණි සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල විචල්‍යතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් කෘති කිහිපයක් ඇසුරිනි.)

## 1. හැඳින්වීම

ආඛ්‍යාන වර්ග අතර සංචාරක ආඛ්‍යාන සුවිශේෂ වාර්තා විශේෂයකි. තම අත්දැකීම් බෙදා හදා ගැනීමේ අරමුණෙන් ලෝකය පුරා සංචාරකයන් සංචාරක ආඛ්‍යාන රාශියක් රචනා කර ඇත. ෆාහියන්, ඉබ්බන් බතූතා, සින්බැඩ්, කොස්මස්, ටොලමි, හියුංසාං හා මාර්කෝපොලෝ ඒ අතර ප්‍රමුඛ වේ. මෙම පර්යේෂණයේදී පැරණි සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල විචල්‍යතා තෝරාගත් කෘති කිහිපයක් ඇසුරින් තුලනාත්මකව අධ්‍යයනය කෙරිණි. ශ්‍යාම වර්ණනාව, විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන යන පැරණි සංචාරක ආඛ්‍යාන සහ කේරළ නළඟන, බෙංගාලි යෙහෙළිය යන නූතන සංචාරක ආඛ්‍යාන පර්යේෂණයේ ප්‍රාථමික මූලාශ්‍රය වේ. එම මූලාශ්‍රය භාවිතයෙන් පැරණි සහ නූතන සංචාරක ආඛ්‍යාන අතර පවතින විචල්‍යතා තුලනාත්මකව අධ්‍යයනයේදී විචල්‍යතා යනුවෙන් වෙනස්කම් නැතහොත් විෂමතා අදහස් විය. එසේම පැරණි සිංහල සංචාරක ආඛ්‍යාන යනුවෙන් සිංහල ජාතියේ ආරම්භයේ පටන් බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන තෙක් සිංහලයන් රචනා කළ සංචාරක ආඛ්‍යානද නූතන සිංහල සංචාරක ආඛ්‍යාන යනුවෙන් නිදහසින් පසු මේ දක්වා සිංහලයන් රචනා කර ඇති සංචාරක ආඛ්‍යානද අදහස් වේ. පැරණි සිංහල සංචාරක ආඛ්‍යාන සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යාන අතර පවතින විචල්‍යතා කවරේද? යන පර්යේෂණ ගැටලුව මුල් කර ගත මෙම පර්යේෂණයේදී තෝරාගත් කෘති කිහිපයක් ඇසුරින් පැරණි සිංහල සංචාරක ආඛ්‍යාන සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යාන තුලනාත්මකව අධ්‍යයනය කරමින් ඒවා අතර පවතින විචල්‍යතා හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ විය. පැරණි හා නූතන සිංහල සංචාරක ආඛ්‍යානවලින් හෙළිවන ආර්ථික, සමාජ හා දේශපාලන තොරතුරු හඳුනා ගැනීම අනු අරමුණක් විය. උක්ත යෝජිත පර්යේෂණ මාතෘකාවට හා අරමුණට ආදාළව සාහිත්‍ය විමර්ශනය සිදු කිරීමේ දී නූතන සිංහල සංචාරකාඛ්‍යාන සහ පැරණි සිංහල සංචාරකාඛ්‍යාන කිහිපයක් හඳුනාගත හැකිය. එහෙත් පැරණි සිංහල සංචාරක ආඛ්‍යාන සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල විචල්‍යතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයන මෙතෙක් සිදු කර නොමැත. එනයින් පැරණි සිංහල සංචාරක ආඛ්‍යාන සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල විචල්‍යතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් යන පර්යේෂණ මාතෘකාවට ආදාළව ප්‍රාථමික, ද්විතීයික හා තෘතීය මූලාශ්‍රය භාවිතයෙන් සාහිත්‍ය විමර්ශනය සිදු විය.

**වගු අංක 01. සාහිත්‍ය විමර්ශනය**

| කර්තෘ | කෘතිය | වර්ෂය | අදාළත්වය |
|---|---|---|---|
| සුරවීර, ඒ. වී. | සාහිත්‍ය විචාර ප්‍රදීපිකා විචාර වචන කෝෂය | 2005 | සාහිත්‍යයේ එන බොහෝ වචන සම්බන්ධයෙන් විවරණ සපයන මෙම විචාර වචන කෝෂයේ දී ආඛ්‍යාන යන්නට විවරණ සපයා ඇත. ඒ අනුව කතාවක් ඉදිරිපත් කිරීමේ දී කතුවරයා විසින් භාවිත කරනු ලබන සියුම් භාෂාමය උපක්‍රම ආඛ්‍යාන විධි වශයෙන් සැලකිය හැකි බව සුරවීර දක්වා ඇත. ආඛ්‍යාන යන්න න්‍යායිකව හඳුනා ගැනීමේ දී මෙම ග්‍රන්ථය වැදගත් වේ. |
| (පරි.) <u>බුද්දත්ත හිමි</u>, පොල්වත්තේ. | හියුංසියංභ්‍රමණවෘත්තාන්තය | 1961 | මෙය අද්භූත ගමන් විස්තරයකි. දේශාටන වාර්තාවලින් ලද හැකි මහඟු ප්‍රතිඵල දක්වන කෘතියක් වශයෙන් මෙය දැක්විය හැකිය. |
| (අනුවාදක) ගුණසේකර, ධනපාල. | අඳුරු සයුරින් එහා මාර්කෝ පොලෝගේ දේශාටන වාර්තාව | 2004 | මෙම කෘතිය මාර්කෝ පොලෝගේ චරිතාපදානය වේ. මෙම කෘතිය හුදු චාරිකා විස්තරයක් පමණක් නොවේ. මාර්කෝ පොලෝගේ නිරීක්ෂණයට ලක් වූ ආර්ථික, සාමාජික, දේශපාලන, සංස්කෘතික ආදි වශයෙන් ජන ජීවිතයේ හැම අංශයක්ම විස්තර කරයි. |
| කහඳගමගේ, පියසේන | වනේ ඇඳුණු පිය සටහන් | 1993 | සිංහල දේශීය සංචාරක ආඛ්‍යාන කෘතියක් වශයෙන් මෙම කෘතිය පෙන්වා දිය හැකිය. |

## 2. ප්‍රතිඵල හා සාකච්ඡාව

මවිසින් යෝජිත මාතෘකාවට අදාළ ව සිදු කරනු ලබන පර්යේෂණය සඳහා උපයුක්ත කරගනු ලබන්නේ ගුණාත්මක දත්තයි. මන්දයත් තෝරාගත් මූලාශ්‍රයවලින් භාවිත කර ගනු ලබන්නේ විස්තරාත්මක සහ ගුණාත්මක දත්තයි. ඒ අනුව මෙහි දී පර්යේෂණ විධි ක්‍රමය ලෙස දත්ත විශ්ලේෂණය යොදා ගනු ලබන අතරම පුස්තකාලය ආශ්‍රයෙන් ලබාගත් තොරතුරුද, ස්වයං කියවීම් ආශ්‍රයෙන් ලබාගත් තොරතුරුද, මෙකී ද්විත්වයටම පරිබාහිර කියවීම්වලින් ලබාගත් තොරතුරුද විස්තරාත්මකව සහ න්‍යායිකව විශ්ලේෂණය කෙරේ.

සංචාරක කතා, සැරිසර විත්ති, චාරිකා සටහන්, දේශාටන වාර්තා, ගමන් තොරතුරු ආදී යෙදුම් මඟින් හැඳින්වෙන සංචාරක ආඛ්‍යාන හෙවත් ගමන් විත්ති සාහිත්‍යය ඉංග්‍රීසියෙන් හඳුන්වනු ලබන්නේ Travel writing නමිනි. **සංචාරක +ආඛ්‍යාන** එකතු වී සන්ධි වීමෙන් සංචාරක ආඛ්‍යාන වචනය නිර්මාණය වී ඇත.

**සංචාරක** යන පදය කෝෂාර්ථයෙහි විග්‍රහ කර ඇත්තේ මෙසේය.

> සංචාරක වි. නිත්‍ය වාස ස්ථානයක් නැති ව තැනින් තැනට ගමන් කරන. 2 තැනින් ඇවිදින. 3 විනෝදය සඳහා යම් යම් දේ නරඹමින් සැරිසරන නාප්‍ර. තැනින් තැනට යන්නා, නිවාඩුවක් ගත කිරීමට හෝ විදේශයක සිට හෝ පැමිණ ඇවිදින්නා. (විජයතුංග, 2005, 1723).

**ආඛ්‍යාන** යන වචනය අර්ථ විවරණය කර ඇත්තේ පහත අයුරෙනි.

> ආඛ්‍යාන නාප්‍ර. 1 කීම, කථනය, ප්‍රකාශ කිරීම; 2 කථාන්තරය, ජන ප්‍රවාද කථාව; 3 උත්තරය, පිළිතුර; 4 පූර්වයෙහි වූ සිද්ධියක් ප්‍රකාශ කිරීම හෝ දැක්වීම. වාක්‍ය ගැන පවසන සම්පූර්ණ වාක්‍ය ඛණ්ඩය. [සං./පා. තත්ස] (විජයතුංග, 2005, 210).

ආඛ්‍යාන යන්නෙහි මතුපිට අර්ථය 'කීම' වේ. එහෙත් ව්‍යවහාරයේදී විවිධ අර්ථයන්හි යෙදේ. සිද්ධි සමූහයක් අර්ථයක් ඇති වන සේ එකිනෙක ගළපා විස්තර කිරීමෙන් ලැබෙන ප්‍රවෘත්තිය ආඛ්‍යානය නමින් හැඳින්විය හැකිය. මේ අනුව ආඛ්‍යානය යන්න 'කථාව' 'කථා ප්‍රවෘත්තිය' යන අර්ථ ගනී. අද්‍යතන සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි, කථාවක් ඉදිරිපත් කිරීමේ මාර්ග අතුරෙන් එකක් ලෙස ආඛ්‍යානය සැලකේ. ආඛ්‍යාන (Narrative), සංවාද (Dialogue), වර්ණනා (Description), විවරණ (Commentary) යන සතරේ සංයෝගයෙන් කථාවක් සම්පූර්ණ වන බව කියනු ලැබේ. ආඛ්‍යාන සංවාද යන කොටස් දෙක එකතු වීමෙන් කථාවක් සම්පූර්ණ වන බව ඇතැම් විචාරකයෝ පවසති. එසේ ගත් කල්හි ඉහත විග්‍රහයේ දක්වනු ලැබූ වර්ණනා විවරණ යන කොටස් දෙකද ආඛ්‍යාන ගණයටම අයත් කෙරෙන බව පෙනේ. මෙම විග්‍රහය වඩාත් අදාළ වන්නේ නවකතා කෙටිකතා ආදී නිර්මාණයන්හි ආඛ්‍යාන විධි (Narrative forms) ගැන සලකා බැලීමේදීය. මේ අනුව, කතාවක් ඉදිරිපත් කිරීමේදී කතුවරයා විසින් භාවිත කරනු ලබන සියලු භාෂාමය උපක්‍රම 'ආඛ්‍යාන විධි' වශයෙන් පුළුල් ලෙස සැලකිය හැකිය. (සුරවීර, 1991, 18-19).

ඒ අනුව පැහැදිලි වන්නේ දෙස් විදෙස්වල සංචාරයේ නිරත වූ සංචාරකයින් එම ගමන් පිළිබඳ විස්තර ඇතුළත් කොට ලියන ලද වාර්තා සටහන් සංචාරකාඛ්‍යාන නමින් හඳුන්වන බවයි. වර්තමානයෙහි නවකතා සහ කෙටිකතා තරමට ඉහළ ජනප්‍රියත්වයක් අත්කරගත් කතා විශේෂයක් ලෙස සංචාරකාඛ්‍යාන හඳුන්වාදිය හැකිය. විධිමත් ගමන් විත්ති සාහිත්‍යයක ආරම්භය සැලසුණේ ග්‍රීක ඉතිහාසඥයන් විසින් ලියන ලද **පර්සියානු යුධ ඉතිහාසය** (විජේරත්න, 2011, 303). කෘතිය ආශ්‍රිතව බව පිළිගත් මතයකි. තම අත්දැකීම් ලෝකය හා බෙදා හදා ගැනීමේ අරමුණෙන් ලෝකය පුරා සංචාරකයන් අතින් සංචාරකාඛ්‍යාන රාශියක් රචනා වී ඇත.

ෆාහියන්, ඉබන් බතූතා, සින්බෑඩ්, කොස්මස්, ටොලමි, හියුංසාං හා මාර්කෝපෝලෝ ඒ අතර ප්‍රමුඛ වේ. පර්නාඕද ක්වේරෝස්, රොබර්ට් නොක්ස්, ජෝන් ඩේවි, හෙන්රි මාෂල්, හෙන්රි කේව්, විල්හෙල්ම්, ජේ. සම්දර් හා බෙල් වැනි අය යටත් විජිත යුගයේදී සිරිලක පුරා ඇවිද චාරිකා සටහන් ලියා තිබේ. යුරෝපීය සංචාරකයන්ගේ සංචාරක වාර්තා සැලකීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ ඔවුන් අන්‍ය රටවල් හා ඒවායේ සංස්කෘති අවප්‍රමාණය කොට තම සංස්කෘතිය පමණක් උසස් හා ශිෂ්ට ලෙස විචාරය කිරීමයි.

ලාංකීය සංචාරක සාහිත්‍යයේ මුල් කාලීන සටහන් සියල්ලම පාහේ ලියැවී ඇත්තේ වෙනත් භාෂාවලිනි. එමෙන්ම සිංහල බසින් ලියැවුණු සංචාරකාඛ්‍යානවල ආරම්භය මේ යැයි නිශ්චිතව කිව නොහැකිය. 15වන සියවසෙන් පසු ලංකාවේ සංචාරකාඛ්‍යාන රාශියක් ලියැවුණු බවක් දැකිය හැකිය. එමෙන්ම නවසිය ගණන්වල මුල් භාගයේ මෙරට පළ වූ ඉංග්‍රීසි පුවත්පත් සහ සඟරා කියවන්නෙකුට ශ්‍රී ලාංකිකයන් විසින් තමන් ලද අත්දැකීම් විස්තර කළ ලිපි ලේඛන රැසක් ඇස ගැටෙන බව කිව යුතුය. දේශීය සංචාරකාඛ්‍යානවල දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ එම වාර්තාවල විස්තර රටවල තොරතුරු මධ්‍යස්ථව සුබවාදී ආකාරයෙන් දැක්වීමයි.

චීන ජාතික ෆාහියන් හිමියන්ගේ දේශාටන වාර්තා මුල් කාලීන සිංහල සංචාරකාඛ්‍යානවලට විශේෂ අභිප්‍රේරණයක් විය. එම දේශාටන වාර්තාවන්හි අගනා පරිවර්තන කීපයක්ම සිංහල බසින් පළ වීම ඊට හේතු වේ. මුල් කාලීන සිංහල ගමන් විස්තර කෘති බොහොමයක් ලියැවී ඇත්තේ ඉන්දියානු හෙවත් දඹදිව සංචාර අළලාය. "මේ අතරින් වෛද්‍යවරයෙකු වූ ඩී. එච් ධර්මතිලක විසින් රචිත දඹදිව ගුරා හෙවත් දඹදිව වන්දනා ගමන් විස්තරය විශේෂ වූවක් බව ප්‍රකට ගමන් විත්ති ලේඛකයෙකු වූ කපිල කුමාර කාලිංග සඳහන් කරයි." (විජේරත්න, 2011, 304).

බඹරැන්දේ සිරි සීවලී හිමියන්ගේ **ඉන්දියානු ජීවිතය** (විජේරත්න, 2011, 304). සිට සෝමචන්ද්‍ර ගමගේ විසින් ලියන ලද මෑතක පළ වූ ඉන්දියාවේ සංචාරයට අත්වැලක් කෘතිය දක්වා සිංහල භාෂාවෙන් රචනා වූ ඉන්දියානු ගමන් විත්ති පොත් සංඛ්‍යාව ඉතා දීර්ඝ වේ. මෙම කෘති ඇතැම් ඒවා

ඉන්දියානු ජන ජීවිතය විවරණය කරන අතර ඇතැම් කෘති මාර්ගෝපදේශ අත්පොත් හා සමානය. මේ අතර ස්වකීය ඉන්දියානු සංචාරයේ පෞද්ගලික අත්දැකීම් විස්තර කරන කෘති ද දැක ගත හැකිය.

1950 සිට 1970 දක්වා වූ කාලය තුළ ඉන්දියාවෙන් බැහැර **මා දුටු චෙකොස්ලෝවැකියාව, මා දුටු ඕස්ට්‍රේලියාව, ආසියාවේ ඇවිද්ද පා හා චීන චාරිකා** (විජේරත්න, 2011, 305). වැනි සංචාරකාඛ්‍යාන රචනා වී ඇත. **මායා රංජන්ගේ දිගාමඬුල්ලේ ආශ්චර්ය සහ පියසේන කහඳගමගේ ලේඛකයාගේ වනේ ඇඳුණු පියසටහන්** (විජේරත්න, 2011, 305). දේශීය ගමන් විත්ති කෘති සඳහා නිදසුන් වේ. ලංකාවේ මුල්කාලීන සංචාරකාඛ්‍යාන බොහෝ දුරට ආභාස ලැබුවේ එම වකවානුවේ ඉංග්‍රීසි බසින් ලියැවුණු සංචාරකාඛ්‍යාන ඔස්සේය. සාම්ප්‍රදායික ගමන් විත්ති කලාවේ බාහිර හැඩරුව කාලානුරූපව වෙනස්වීම්වලට ලක් වූවද එහි ආඛ්‍යාන රටාව එයාකාර පරිවර්තනයකට ලක් නොවිණ.

ඒ ආකාරයෙන් පැවති සංචාරක කතා කලාව නව මඟකට යොමු වූයේ පෝල් තේරුගේ **ද ග්‍රේට් රේල්වේ බසාර්** (විජේරත්න, 2011, 306). බස කෘතිය රචනා වීමත් සමඟය. පෝල් තේරුගේ සංචාරක කතා කලාවේ ලක්ෂණයක් වන්නේ පුද්ගල කේන්ද්‍රීය ආඛ්‍යාන රටාවක් වීමයි. පෝල් තේරු සංචාරක කතා කලාවේ නව රැල්ලෙ නියමුවා ලෙස ද සැලකේ. ඔහු සංචාරක කතා කලාවට කිසියම් නැවුම් බවක් ලබා දුන් අතර ජනප්‍රිය ප්‍රබන්ධයට නෑකම් කියන කතා රටාවක්ද හඳුන්වා දුන්නේය.

විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන ලිපිය ලියන ලද්දේ ලක්දිව උපසම්පදාව පිහිටුවා ශාසනය යථා තත්වයට පත් කිරීමේදී දෙවරක්ම සියම් රටට යාමෙන් ඒ රට පිළිබඳ දැනීමක් ලබාගත් විල්බාගෙදර මුදියන්සේ විසිනි. එම ගමනේදී ඇසින් දුටු සියලු දේ විස්තර කරමින් මෙම ලිපිය රචනා කර ඇත.

ස්‍යාම වර්ණනාව රචනා කළ කතුවරයා පිළිබඳ කිසිදු විස්තරයක් එම ග්‍රන්ථයේ කිසිතැනෙක සඳහන් නොවන නමුත් පුඤ්චිබණ්ඩාර සන්නස්ගල මහතා සඳහන් කරන්නේ මෙය විල්බාගෙදර මුදියන්සේගේ කෘතියක් විය යුතු බවයි.

නුවර යුගයේදී රචනා වූ කෘතියක් ලෙස මෙම ස්‍යාම වර්ණනාව හැඳින්විය හැකිය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස වැලිවිට සරණංකර මාහිමියන්ගේ බලවත් ඉල්ලීම පරිදි සියම් දේශයේ රජතුමා සතුටු කොට ගෙන උපාලි තෙරුන් ඇතුළු භික්ෂු පිරිසක් ලංකාවට වඩමවා ගෙන ඒම පිළිබඳ පුවත මෙම කෘතියෙහි අන්තර්ගතය. ග්‍රන්ථය රචනා කිරීමේ පරමාර්ථය පහත පරිදි හඳුනා ගත හැකිය.

ලංකා ඉතිහාසයේ නුවර යුගයෙහි ක්‍රිර්ති ශ්‍රී රාජසිංහ රජු දවස වැලිවිට සරණංකර මාහිමියන්ගෙ අප්‍රතිහත ධෛර්ය මුල් කොට ගෙන ශ්‍රී ලංකාවේ බුද්ධශාසනය සුරක්ෂිත කරමින් නැවතත් සියම් උපසම්පදාව පිහිටුවා බුද්ධශාසනය සුරක්ෂිත කිරීම පිළිබඳ ඓතිහාසික සිද්ධිය දුටු අයුරින් ම අනාගත ලෝකයාගේ දැන ගැනීම පිණිස වාර්තා කොට තැබීම මෙම ග්‍රන්ථයේ පරමාර්ථය වූ බව පැහැදිලිය. (පඤ්ඤාලෝක හිමි, 1998, 19).

ශ්‍රී ලංකාවේ සියම් උපසම්පදාව ක්‍රි. ව. 1753 ජූලි මස 20 වැනි සෙනසුරාදා දින සිදු වූ බව සැලකෙන අතර එම කාලයට ආසන්න අවස්ථාවක මෙම කෘතිය සම්පාදනය වූ බව සැලකිය හැකිය. පරිච්ඡේද සංඛ්‍යාව 17කි.

නූතන සංචාරකාඛ්‍යාන රචනයේ පුරෝගාමී චරිත ද්විත්වයක් ලෙස නීල් විජේරත්න හා එස්. පී. එස්. වීරසිංහ හඳුන්වාදිය හැකිය. නීල් විජේරත්න රචනා කළ කේරළ නළඟන කෘතිය ඉන්දීය සමාජය වටා ලියැවී ඇත. මෙහි පරිච්ඡේද සංඛ්‍යාව හයකි. ලියැවී ඇත්තේ පොන්ඩිචෙරි, මදුරාසි බංගලෝර් බොම්බාය හා කල්කටා ආදි නගරවල සිදු වූ සිදුවීම් පසුබිම් කරගෙනය.

බෙංගාලි යෙහෙළිය නිර්මාණයද නීල් විජේරත්න ඉන්දීය සමාජය අළලා රචනා කර ඇත. 2005 දෙසැම්බර් මස මුල් වරට ප්‍රකාශයට පත් වූ මෙම කෘතිය කතුවරයා සිළුමිණ පුවත්පත්ට ලියූ **ආදම්ගේ පාලම** තීරු ලිපි මාලාව හා ලක්බිම ඉරිදා සංග්‍රහයට ලියූ **නමස්තේ** තීරු ලිපි මාලාවෙන් තෝරාගත් ලිපි සමූහයකින් සමන්විත විය. මෙහි එන ලිපි සංඛ්‍යාව 40කි. කේරළ නළඟන කෘතියේ එරික් ඉලයප්ආරච්චි නීල් විජේරත්න පිළිබඳ පහත සටහන තබා ඇත.

ඉන්දියානු ජීවිතය පිළිබඳව නීල් විජේරත්නයන්ගේ පුවත්පත් කැටයම් තුළ ප්‍රකට වන්නේ ද මේ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි ලිබරල් ලේඛකත්වයයි. ඉන්දියානු චාරිකා මෙන්ම ඒ පිළිබඳ ඔහුගේ ධාරණා ද ඔහුගේ සරල බස් වහරද ඒ සියල්ලට ම වඩා සමකාලීන මිනිස් ජීවිතවල ආදර්ශයක් ලෙස ඉන්දියානු ජීවිතය දැකීම සඳහා ඔහු තුළ පවත්නා නායිපෝලියානු ශික්ෂණය ද ශ්‍රී ලාංකීය පාඨක සමාජයට අලුත් අත්දැකීමක් වනවාට සැක නැත. (විජේරත්න, 2008, 6).

එස්. පී. එස්. වීරසිංහ විසින් රචිත කෘතියක් වන හුළං හොරු ශ්‍රී ලංකාවේ විවිධ ස්ථාන විස්තර කරමින් රචනා වූවකි. පරිච්ඡේද ගණන 10කි. අඩවිය මැදින් එරුපතානේ නටබුන් අතරට, අවාරයේ මීමුරේ ගියා වගේ, හුළං හොරු සීගිරි, සීගිරි සුකුමාළියේ පෙර රජ දවසේ, මින්නේරි අලි හරි සැරයි, තොටුපොළ කන්ද උඩ, මාලිබොඩ පාරේ අවාරේ, පරවි දූවට, කිඹුලාගල චාරිකාව හා ජේතවනාරාමයේ කොත මුදුනට ආදී වශයෙනි. කතුවරයා තම අත්දැකීම් විස්තර කිරීමේදී සරල කථන ශෛලියක් යොදා ගනිමින් නිර්මාණාත්මක පරිකල්පන ඔස්සේ පාරිසරික වර්ණනා සිදු සිදුක කර ඇත.

මෙම පර්යේෂණයේදී පැරණි සිංහල සංචාරකාඛ්‍යාන සහ නූතන සිංහල සංචාරකාඛ්‍යාන අතර වෙනස්කම් හඳුනා ගැනීමේදී යථෝක්ත මූලාශ්‍රය ලෙස යොදා ගනියි. ඒ අනුව පැරණි හා නූතන සිංහල සංචාරකාඛ්‍යාන අතර වෙනස්කම් රාශියක් හඳුනාගත හැකිය.

**භාෂා ස්වරූපයේ විචල්‍යතා**

මහනුවර යුගය යනු ශ්‍රී ලංකාව සමාජීය ආර්ථික ආගමික අධ්‍යාපනික හා සංස්කෘතික අංශයන්ගෙන් මෙන්ම සාහිත්‍යමය වශයෙන්ද පිරිහී ගිය කාලපරිච්ඡේදයකි. එකල බොහෝ සෙයින් නිර්මාණකරණයේ යෙදුණේ සාමාන්‍ය ජනතාවයි. ව්‍යවහාරයෙන්ම ලේඛන කාර්යයේ නියැලුණි. මෙම පර්යේෂණයේදී පරිශීලනය කරන කළ පැරණි සංචාරකාඛ්‍යාන කෘතියක් වන මහනුවර යුගයේ රචිත ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන කෘතිය තුළද එම ලක්ෂණය හඳුනාගත හැකිය. **කියලා, උන්නැහේලා, අඩගාගෙන** (පඤ්ඤාලෝක හිමි, 1998, 56). වැනි වචන ඊට නිදසුන් වේ. සමස්තයක් වශයෙන් මුළු කෘතියම කථන භාෂාවෙන් ලියා ඇත. එමෙන්ම නූතන සිංහල සංචාරකාඛ්‍යාන කෘති ලියැවී ඇත්තේද කථන භාෂා ව්‍යවහාරයෙනි. "එදා රාත්තිරිය හිටියේ මහ කච්චකොඩිය පන්සලේ..."(වීරසිංහ, සඳහන් නොවේ, 1)., "හැටට හැටේ වාහනය එළවන්න" ( විජේරත්න, 2008, 12) වැනි වාක්‍ය ඛණ්ඩ නිදසුන් වේ. ඒවායේ ඇතැම් තැනක ලේඛන භාෂාමය වචනද හඳුනාගත හැකිය. "පාතරාසය, රසාලිප්ත ගද්‍ය කාව්‍යයක්, වදන් ලාවණ්‍යය" (විජේරත්න, 2008, 42,64). ආදී වචන ඊට නිදසුන් වේ.

භාෂා ස්වරූපය පිළිබඳ සාකච්ඡාවේදී වාක්‍යවල දීර්ඝත්වයද සලකා බැලීම වැදගත් වේ. මින් අදහස් වනුයේ දිගු හෝ කෙටි වැකි ද යන්නයි. ඒ අනුව ඉපැරණි සංචාරකාඛ්‍යානවල භාවිත වනුයේ දිගු වැකිය. මෙහිදී දැකිය හැකි විශේෂත්වය වනුයේ කෘදන්ත හා පූර්ව ක්‍රියා යොදා ගනිමින් දීර්ඝ වාක්‍ය නිර්මාණය කර තිබීමයි.

"දොහොත් මුදුන් දී සිටිනා ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුසිතදි දිව්‍ය රූ හා නානාරූ කැලැන්ගෙන් ගහනව මේ සියලු දෙයම රන්කම් කර...." (පඤ්ඤාලෝක හිමි, 1998, 50). "නිල්මාණික්‍යයක් සාදා මණ්ඩපය ඇතුළෙන් ශ්‍රීපාදය මත්තේ...."(පඤ්ඤාලෝක හිමි, 1998, 60). ආදී වාක්‍ය නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. ඒ හා සැසඳීමේදී නූතන සංචාරකාඛ්‍යානවල දැකිය හැක්කේ කෙටි වැකි ස්වරූපයකි. "තොටුපොළ කන්ද තියෙන්නෙ හෝර්ටන් තැන්නේ" (වීරසිංහ, සඳහන් නොවේ, 62). "වල්පොලමුල්ල කියන්නෙ ලංකාවෙ තියෙන පොඩිම. ඒ වාගෙම දුෂ්කර ගමක්...." (වීරසිංහ, සඳහන් නොවේ, 36). නූතන සංචාරකාඛ්‍යානවල ඇතැම් තැනක දීර්ඝ වාක්‍ය භාවිතා කරන ආකාරයක් හඳුනාගත හැකිය. බෙංගාලි යෙහෙළිය කෘතියේ පහත වාක්‍ය ඊට නිදසුන් වේ.

> "ජනාකීර්ණ හව්රා පාලමින් එතෙර වීම වේලාව ගත වනනක් බැවින් රාජකාරි කටයුතු සඳහා කල්කටා නගරයට එන...." (විජේරත්න, 2005, 51).

භාෂාවේ සරල බව යන්නෙන් අදහස් කරන්නේ භාෂාවේ සරල හෝ සංකීර්ණ ස්වභාවයයි. බොහෝ විට වාක්‍යවල දීර්ඝත්වය සහ භාවිත වචන අනුව නිර්මාණ සරල හෝ සංකීර්ණ ස්වභාවයක් ගනියි. ඒ අනුව පැරණි සංචාරකාඛ්‍යානවල දීර්ඝ වාක්‍ය භාවිත වීම නිසා එහි ඇත්තේ සංකීර්ණ භාෂා රටාවකි. තවද එහි භාවිත භාෂාව පැරණි භාෂා රටාවට ආවේණික වීම හේතුවෙන් එකල සමාජයට හුරු පුරුදු වුවද වර්තමාන සමාජයට නුහුරු නුපුරුදු වේ. එහෙයින් පැරණි සංචාරකාඛ්‍යානවල භාෂාව සංකීර්ණ වේ. කෙටි වැකි සහිත නූතන සංචාරකාඛ්‍යානවල භාෂා රටාව සරල වේ. වර්තමානයේ භාෂක සමාජයේ භාවිත එම භාෂාව වත්මන් පාඨකයාට හුරුපුරුදු වීම නිසා ද නූතන සංචාරකාඛ්‍යාවල භාෂාව සරල බව පැවසිය හැකිය.

අදහස් ප්‍රකාශනයේදී වැදගත්ම අංගය ලෙස වාක්‍ය හැඳින්විය හැකිය. සිංහල භාෂාවේ කථන ව්‍යවහාරයේදී එන වාක්‍ය රටාවට වඩා විශාල වශයෙන් වෙනස් වූ වාක්‍ය රටාවක් ලේඛන ව්‍යවහාරයේදී දක්නට ලැබේ. එනම් ලේඛන ව්‍යවහාරයේ ව්‍යාකරණය කථන ව්‍යවහාරයේ ව්‍යාකරණයෙන් වෙනස් වේ. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හේතුවෙන් වාක්‍යවල මෙම වෙනස සිදු වේ. නිවැරදි රීති අනුගමනය කරමින් වාක්‍ය රචනය වාක්‍ය වින්‍යාසය යනුවෙන් මෙහිදී අදහස් කෙරේ. පැරණි සංචාරකාඛ්‍යානයක් වන ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන කෘතියෙහි බහුල වශයෙන් නූතන අර්ථයෙන් වාක්‍ය වින්‍යාසයේ දෝෂ දැකිය හැකිය. නමුත් එය නූතන කථා ව්‍යවහාරයේ යෙදෙන අතීත කාල ආඛ්‍යාත රූපවලට අවසානයේ **"ය"** නිපාතය තැබූ අවස්ථාවක් ලෙස හඳුන්වාදීම වඩාත් යුක්ති යුක්තය. තත් යුගයේ කටවහර ඇසුරෙන් ලේඛන ව්‍යවහාරයක් සකසා ගැනීමට කතුවරයා උත්සහ දරා ඇති බව පෙනේ.

> "සියම් රදලවරු මෙම වෙලේ ම එවා වදාළාය" (පඤ්ඤාලෝක හිමි, 1998, 44).
>
> "සියම්නිලමක්කාර උන්නැහෙලා ගියාය" (පඤ්ඤාලෝක හිමි, 1998, 64).

එමෙන්ම ඇතැම් තැනක පුරුෂලිංග ආඛ්‍යාත ද තබා ඇති ආකාරයක් දැකිය හැකිය.

> ".... පිළිමරූ වහන්සේලාට වන්දනා කළේය"(පඤ්ඤාලෝක හිමි, 1998, 63).

"මෙහි බොහෝ පිළිමරූ පිහිටියේ ය"(පඤ්ඤාලෝක හිමි, 1998, 63).

පැරණි සංචාරකාඛ්‍යාන හා සලකා බැලීමේදී නූතන සංචාරකාඛ්‍යානයන්හි වාක්‍ය වින්‍යාස දෝෂ අවම වේ. නිවැරදි ආඛ්‍යාත ගළපා තිබේ.

"කාන්තාව යාන්තමට සිනාසෙන්නී ය" (විජේරත්න, 2005, 17).

".... ඔවුහු ඒ ගැන ප්‍රශ්න කළ හ" (විජේරත්න, 2008, 30).

"මම පිළිතුර දුනිමි" (විජේරත්න, 2008, 28).

ඒ අනුව පැහැදිලි වන්නේ පැරණි සිංහල සංචාරකාඛ්‍යාන සහ නූතන සිංහල සංචාරකාඛ්‍යාන වාක්‍ය වින්‍යාසය හේතුවෙන් එකිනෙකාට වෙනස් වන බවයි.

අක්ෂර වින්‍යාසය යනු නිවැරදි අකුරු යොදා ගනිමින් වචන ලිවීමයි. ලේඛන ව්‍යවහාරයේදී ලේඛකයා අදහස් කරන දෙය හැර වෙනත් අරුතක් පාඨකයාට නොහැඟීම සඳහා නිවැරදි අක්ෂර වින්‍යාසය භාවිත කිරීම වැදගත් වේ. නැතහොත් ලේඛන දෝෂ වැළක්වීම සඳහා නිවැැරදි අක්ෂර වින්‍යාසය වැදගත් වේ. නූතන සංචාරකාඛ්‍යාන හා සැසඳීමේදී පැරණි සංචාරකාඛ්‍යානවල අක්ෂර වින්‍යාස දෝෂ බහුලය. " පනිවුඩ, සණ්හසද, නම්භූචාරිත්‍රයෙන්, වයිතාලවේලාවට" (පඤ්ඤාලෝක හිමි, 1998, 37-39). යනාදි වචන ඊට උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය. ඒ හා සැසඳීමේදී නූතන සංචාරකාඛ්‍යානවල අක්ෂර වින්‍යාස දෝෂ අවමය. නමුත් නූතන සංචාරකාඛ්‍යානයන්හිද ඇතැම් අක්ෂර වින්‍යාස දෝෂ පැවතිය හැකිය. සිංහලයේ හුළං හෝ සුළං යන වචනය ලිවීමේදී මූර්ධජ ළ කාරය යොදාගත යුතු බව පිළිගැනීම වේ. එහෙත් එස්. පී. එස්. වීරසිංහගේ කෘතියේ ඇතැම් තැනක හුළං යන්න **හුලං** ලෙස සඳහන් වේ.

තවද ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන කෘතියේදී බොහෝ විට සංස්කෘත මිශ්‍ර භාෂා ස්වරූපයක් දැකිය හැකිය. "ස්වස්ති ශ්‍රි වෛවශ්තමනුසඞ්ඛ්‍යාත මහා සම්මත පරම්පරානුයාත සුද්ධ සූය්‍ය වංශාභිජාත රාජාධිරාජ පරමේශ්වර...." (පඤ්ඤාලෝක හිමි, 1998, 37). එහෙත් නූතන සංචාරකාඛ්‍යානවල සංස්කෘත වචන භාවිතයක් දක්නට නොමැත. ඇතැම් තැනක " මිස්ටර්, ඉන්ටර්නැෂනල්, බජට්, වෝටර් හා මොර්නිං" (විජේරත්න, 2008, 10, 16, 17, 50). යනාදි ඉංග්‍රීසි වචන භාවිත කර ඇත.

පැරණි සංචාරකාඛ්‍යානවල හුදු ගමන් විස්තරයක් සිදු කිරීම පමණක් අරමුණු වීම නිසා ගැමි බස් වහරක් භාවිත නොකරයි. ඉඩ ලද සෑම අවස්ථාවකම කතුවරයා පණ්ඩිත මෙන්ම බහුශ්‍රැත ආකාරයකින් යුතු සංකීර්ණ පද බහුල කථන භාෂාවක් යොදා ගනියි. එහෙත් නූතන සංචාරකාඛ්‍යානවල බස සරලය. එමෙන්ම ගැමි බසද යොදාගෙන තිබේ. " දූවිලි ඇබින්දක්වත්, ඩිංගෙන් ඩිංග ගිනියම් වන අයුරු, ගිනි පූටකේ, නිනච්චක්, නාස්පුඩු කඩා, තනිපංගලමේ" (විජේරත්න, 2008, 13, 15, 79, 82). " කඩිමුඩියේ, තව ඩිංග වේලාවක්, දීපංකරේක, තකහනියක්, කචබචය" (විජේරත්න, 2005, 16, 17, 46, 52, 53). යනාදී වචන ඊට නිදසුන් වේ. මෙම ගැමි බස උපයෝගී කර ගැනීම හේතුවෙන් භාෂාව සුපෝෂණය වී ඇති අතර ආකර්ශනීය ගුණය හා පාඨක රුචිය වර්ධනය වී තිබේ.

කාව්‍යාත්මක භාෂා භාවිතයද ආඛ්‍යානවල කැපී පෙනේ. මෙහිදී කාව්‍යාත්මක භාෂාවක් යනුවෙන් අදහස් කෙරෙන්නේ අලංකාරවත් භාෂාවක් නැතහොත් කාව්‍ය නිර්මාණය සඳහා උචිත අන්දමේ භාෂාවකි. "මෝදු වන මද්දහනේ, සැදෑ අඳුර සනකම් වන මොහොතක, රත්තරන් පොළොව, අර මල් පොකුරු සිනාවෙති, මා තුළ මෝරන්නට විය" (විජේරත්න, 2008, 14, 20, 39, 69, 74). "ගත විඩා නිවාලන- සිත සනසාලන-සකලාකාර රිදුම් වේදනා සමනය කරන සම්බාහනයකට ඇරියුමක්" (විජේරත්න, 2008, 90). වැනි වාක්‍ය ඛණ්ඩ නිදසුන් වේ.

පැරණි සංචාරකාඛ්‍යානයක් ලෙස හඳුනාගන්නා ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන කෘතියේ එවැනි කාව්‍යාත්මක භාෂා භාවිතයක් දක්නට නොලැබේ. එහෙත් මෙම කෘතියේ එක් ස්ථානයකදී විරිතක සුවඳ දෙන එනම්, වෘත්ත ගන්ධ ශෛලියේ වාක්‍ය ඛණ්ඩයක් හෙවත් ගද්‍යමය කාව්‍ය කොටසක් හඳුනාගත හැකිය. "ස්වස්ති ශ්‍රි ප්‍රසස්තවර සර්ව මංගල්‍ය විකසිත කමල මෞලි...." (පඤ්ඤාලෝක හිමි, 1998, 89). නූතන සංචාරකාඛ්‍යානවල සුලබ ලක්ෂණයක් වන කාව්‍යාත්මක භාෂා භාවිතය පැරණි කෘතිවල දුලබ ලක්ෂණයක් බව මින් පැහැදිලි වේ. ඒ අනුව කාව්‍යාත්මක භාෂා භාවිතයද පැරණි හා නූතන සංචාරකාඛ්‍යාන අතර පවතින වෙනස්කමක් බවට පත් වේ. බස රසවත් කිරීමටත් ප්‍රාණවත් කිරීමටත් සිංහලයේ භාවිත කරන විවිධාකාර වූ යෙදුම් සාම්ප්‍රදායික යෙදුම් ලෙස හැඳින්වේ. යුගල පද, ඉඟිවැකි, ආප්තෝපදේශ හා ප්‍රස්ථාව පිරුළු ලෙස මේවා වර්ග කළ හැකිය. නූතන සිංහල සංචාරකාඛ්‍යානවල උක්ත සඳහන් සාම්ප්‍රදායික යෙදුම් දැකිය හැකිය. "ගෙවල් දොරවල්, වචන ගැට ගසමින්, හට්ටි මුට්ටි, නම්බුනාම" (විජේරත්න, 2005, 18, 16, 46, 57). යනාදි වචන නිදසුන් වේ. ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන කෘතියේ එවැනි යෙදුම් භාවිතය අවම වේ. ඇතැම් තැනක **පඬුරු පාක්කුඩම්** වැනි වචන දැකිය හැකිය. පැරණි සංචාරකාඛ්‍යානවල සංවාදශීලී භාෂා රටාවක් දක්නට නොමැත. හුදෙක් එම ආඛ්‍යානවල අරමුණ එකී ගමන් විස්තර පිළිබඳ ලෝකය දැනුම්වත්

කිරීම පමණකි. හුදු වාර්තා ලෙසින් ඒවා ඉදිරිපත් වී ඇත්තේ එබැවිනි. පෝල් තේරුගේ ද ග්‍රේට් රේල්වේ බසාර් කෘතිය සමග සංචාරකාඛ්‍යාන කලාව වෙනස් මගක් ගත් අතර අද බිහිවන සංචාරකාඛ්‍යාන බොහොමයක් නවකතා හා කෙටිකතා ලක්ෂණ පෙන්නුම් කරයි. ඒ අනුව සංවාදශීලී භාෂා රටාව ද නූතන සංචාරකාඛ්‍යානවල දැකිය හැකි ලක්ෂණයකි.

> "සෑර්! ලන්ච්, රූම් සර්විස්?
>
> සර් අද ලොකු රවුමක් ගිහිල්ලා වාගෙ" (විජේරත්න, 2008, 55, 68).
>
> "සර්ට මම කතාවක් කියන්නම්" (විජේරත්න, 2005, 97).

ඉහත සඳහන් වාක්‍ය ඛණ්ඩ සංවාදශීලී භාෂා රටාවට උදාහරණ වේ. පැරණි සංචාරකාඛ්‍යානවල සංවාදශීලී භාෂා රටාවක් නොමැතිවීම හා නූතන සංචාරකාඛ්‍යාවල සංවාදශීලී භාෂාවක් දැකිය හැකි වීම නිසාවෙන්ද මේවා එකිනෙකට වෙනස් ලක්ෂණ සහිත බව කිව හැකිය. තවද වචන භාවිතය සැලකීමේදීද නූතන සංචාරකාඛ්‍යානවල ශබ්දවලින් යුත් වචන නොමැති අතර පැරණි සංචාරකාඛ්‍යානවල 'ඒ' කාර 'ඕ' කාර ශබ්ද සහිත වචන දැකිය හැකිය. "දෙනවා හොඳේ, සැලකරණවා හොඳේ, දත්වොට, දම්වොලින්" (පඤ්ඤාලෝක හිමි, 1998, 81, 89). යනාදී වචන උදාහරණ වේ.

**චිත්ත රූප මැවීම**

චිත්ත යනු සිතය. සිතෙහි හට ගන්නා රූප චිත්‍ර ලෙස සරලව හැඳින්විය හැකිය. මෙය සංකල්පමය සිතුවමකි. ඒ අනුව අදාළ කෘතිය පරිශීලනයේදී කෘතියේ සඳහන් වචන මඟින් පාඨක සිතෙහි සංකල්ප රූප මැවීම චිත්ත රූප මැවීම නම් වේ. නූතන සංචාරකාඛ්‍යානයන්හි බොහෝ අවස්ථාවන්හිදී මෙම ලක්ෂණය දැකිය හැකිය.

"ඉබ්බෙක් යනව වගේ හෙමින් හෙමින් තමා ඩොල්පින් එක ඇදෙණ්ඩ ගත්තෙ...." (වීරසිංහ, සඳහන් නොවේ, 14). "....මල් පොකුරක් වන් පියකරු සිනාවක් ඇගේ මුහුණේ සනිටුහන්ව තිබිණ" (විජේරත්න, 2008, 69).

නූතන සංචාරකාඛ්‍යාන රචනා වී ඇති සරල භාෂා රටාව ඊට බලපා ඇති බව සිතිය හැකිය. එහෙත් පැරණි සංචාරකාඛ්‍යාන කියවා චිත්ත රූප මැවීම අසීරුය. එහි සංකීර්ණ භාෂා ස්වරූපය ඊට බලපා ඇත.

**භාවාත්මක හැඟීම් උද්දීපනය**

භාවාත්මක හැඟීම් උද්දීපනය කිරීමේදීද නූතන සහ පැරණි සංචාරකාඛ්‍යාන අතර වෙනසක් දැකිය හැකිය. භාවාත්මක හැඟීම් උද්දීපනය යනු මෙම පර්යේෂණයට අදාළව කෘතිවල ඇතුළත් ඇතැම් වචන, වාක්‍ය හෝ ඡේද කියවීමේදී පාඨකයා තුළ මතුවන හැඟීමය. පැරණි සංචාරකාඛ්‍යානවල පරමාර්ථය තමා ලද අත්දැකීම් ලේඛනගත කොට අනාගතය සඳහා සුරක්ෂිත කිරීම පමණක්ම හේතුවෙන් භාෂාවේ අලංකාර විධි ආදිය පිළිබඳ සැලකිල්ලක් නොදක්වයි. ඒ හේතුවෙන් එම සංචාරකාඛ්‍යාන කෘති ඔස්සේ භාවාත්මක හැඟීම් උද්දීපනය සිදු නොවේ. ඊට සාපේක්ෂව නව මගක් ගත් නූතන සංචාරකාඛ්‍යාන ඔස්සේ භාවාත්මක හැඟීම් උද්දීපනය කරයි.

> "කවදාවත් නැහැ. කවදාවත් අපි මේ රත්තරන් පොළොව අතැරලා යන්නේ නැහැ" (විජේරත්න, 2008, 39).

**තොරතුරු දැක්වීමේ ක්‍රමය**

තොරතුරු දැක්වීමේ ක්‍රමය හේතුවෙන්ද පැරණි සහ නූතන සංචාරකාඛ්‍යාන එකිනෙකට වෙනස් වේ. තොරතුරු දැක්වීම යනුවෙන් හඳුන්වනුයේ අදාළ සංචාරකාඛ්‍යානයෙහි ඊට අදාළ රට ප්‍රදේශ හා සිදුවීම් ආදිය විස්තර කරන ආකාරයයි. ඉපැරණි සංචාරකාඛ්‍යානවල තොරතුරු විස්තර කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ තොරතුරු විස්තරාත්මක දැක්වීමයි. එහිදී විශේෂයෙන් දින පිළිබඳ සඳහන් කරන ආකාරය සුවිශේෂ වේ. එහිදී දිනය ඉතාමත් සවිස්තරාත්මකව දක්වයි. ඉපැරණි සංචාරකාඛ්‍යානයක් වන ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන කෘතියේ දින පිළිබඳ දක්වා ඇත්තේ පහත අයුරිනි.

> "විසේනිය නම් තිථිය ලත් බ්‍රහස්පතින්දා උදයා දී විසිඅට පැය වේලාවට සුභයෝගවූ හතේ නැකත හා මකර...." (පඤ්ඤාලෝක හිමි, 1998, 40).
>
> "සකවර්ෂ එක්වාදහස් සසිය සැත්තෑ තුනට පැමිණි ප්‍රජාපති නම් මේ වරුෂයෙහි මේෂරවි එකොලොස්...."

එහෙත් නූතන සංචාරකාඛ්‍යානවල දින පිළිබඳ විස්තරාත්මක දැක්වීමක් දක්නට නොලැබේ. එහෙත් නූතන සංචාරකාඛ්‍යානවලද දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වේ. එනම් ඇතැම් තොරතුරු ඉදිරිපත් කිරීමේදී සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීමයි. නීල් විජේරත්නගේ සංචාරකාඛ්‍යානවල ඉන්දියාවේ ඇතැම් ස්ථාන වර්ණනා කිරීමේදී ලංකාව හා සංසන්දනය කරමින් ඉදිරිපත් කරන ආකාරයක් දැකගත හැකිවීම නිදසුන් වේ.

> "මුහුදු වෙරළට සමාන්තරව ඇදෙන මේ අලුත් පාර අපට අපට...." (විජේරත්න, 2008, 12).
> "අපේ රටේ 'මාතර බත් කඩයක්' සහ 'ගම්පහ බෙහෙත් ශාලාවක්' නොමැති නගරයක්" (විජේරත්න, 2008, 109).

පැරණි සංචාරකාඛ්‍යානවල එවැනි සංසන්දනාත්මක රටාවක් දක්නට නොලැබේ. එහි ඇත්තේ හුදු වාර්තාමය ස්වභාවයක් පමණකි. නූතන සංචාරකාඛ්‍යානවල දැකිය හැකි තවත් ලක්ෂණයක් වනුයේ අදාළ කෘති මඟින් ඉදිරිපත් කරන රටවල සමාජ තොරතුරු දැක්වීමේදී සමාජ, දේශපාලන, ආර්ථික, ආගමික, අධ්‍යාපනික හා සංස්කෘතික තොරතුරු ද දැක්වීමයි. විශේෂයෙන් මෙම පර්යේෂණයේදී සාකච්ඡා කරන නීල් විජේරත්නගේ කෘති පරිශීලනයේදී ඉන්දීය සමාජය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව ඇත.

> "පොන්ඩිචෙරි ටවුමේ පාරවල් පටුය. ජනාකීර්ණ ය." (විජේරත්න, 2008, 15).

> "අපේ ඊශ්‍රායෙල් ජාතික යාළුවෙක් කීවා මදුරාසියට..." (විජේරත්න, 2008, 38).

> "පාර දෙපස රතු මිදි කරත්ත පෝලිමකි, තවත් තැනෙක...." (විජේරත්න, 2008, 61).

> "සන්දේපත් මසාජ් පාලර්(ර්ර්)....සර්(ර්ර්) තැන්ක්යූ..." (විජේරත්න, 2008, 90).

> "ඉඩ්ලි, තෝසේ, පූරි, චපාති" (විජේරත්න, 2008, 14).

උක්ත නිදසුන් මගින් පිළිවෙළට ඉන්දීය සමාජ තොරතුරු, ඉන්දියානු ආගමික කේන්ද්‍රස්ථානයක් වන ඔරුවිල් ආගමික මධ්‍යස්ථානය, ඉන්දියානු සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකය, ඉන්දියානුවන් ඉංග්‍රීසි භාෂාව හසුරුවන ආකාරය හා ඉන්දීය ආහාර සංස්කෘතිය පිළිබඳ තොරතුරු හෙළි වේ.

එමෙන්ම ශ්‍රී ලාංකේය සමාජ පසුබිම වර්ණනා කරමින් ලියන ලද එස්. පී. එස්. වීරසිංහගේ හුළං හොරු කෘතිය ලාංකේය ප්‍රෞඪ ඉතිහාසය හෙළිදරව් කරන අතරම භෞතික සංස්කෘතික වස්තූන් විස්තර කරමින් රචනා වූ කෘතියකි.

> "ජල උයනයි, ගල් පර්වතයයි මැද තියෙන්නෙ ගල් උයන...." (වීරසිංහ, සඳහන් නොවේ, 48).

3.

> "ක්‍රි. ව 276 - 303 දී මෙතනට ආ මේ දාගැබේ ආදි කර්තෘ.... (වීරසිංහ, සඳහන් නොවේ, 104).

මේ අනුව නූතන සංචාරකාඛ්‍යාන තොරතුරු දක්වන ආකාරය කිසියම් නිරවුල් ආකාරයක් පෙන්වයි. නමුත් පැරණි සංචාරකාඛ්‍යානවල නිරවුල් බවක් දැකගත නොහැකිය.

තවද සමාජයේ සියලු අංශ ආවරණය වන පරිදි තොරතුරු දැක්වීමක් සිදු කර නොමැත. විශේෂයෙන් එහි දැකගත හැක්කේ සියමය එනම් වර්තමාන තායිලන්තයේ ආගමික තොරතුරුය.

> "මෙහි කර්මාන්ත දුටු හැටිනම් සියම් ගඟ දකුණු පාර්ශවයෙහි...." (පඤ්ඤාලෝක හිමි, 1998, 47).

> "....සංඝාරාම වලින් පිරී තිබූ විහාරයකට පැමිණ එහි...." (පඤ්ඤාලෝක හිමි, 1998, 52).

එමෙන්ම තොරතුරු දැක්වීමේදී නූතන සංචාරකාඛ්‍යාන වරහන් භාවිත කරමින් විස්තර කිරීමද සුවිශේෂ වේ.

"උදෑසන හයේ සිට හතහමාර දක්වා කාලය යෝග ව්‍යායාම සඳහා (ඊයේ මම ගණන් බැලුවා හතළිස් දෙනෙක් අපේ වාඩියේ හිටියා" - නොරිත්) (විජේරත්න, 2008, 42). නමුත් පැරණි සංචාරකාඛ්‍යානවල තොරතුරු විස්තර නොකරයි. ඒ අනුව පැහැදිලි වන්නේ තොරතුරු දැක්වීමේ ආකාරය අනුව පැරණි හා නූතන සංචාරකාඛ්‍යාන වෙනස් බවයි.

**තේමාව හෙවත් වස්තු විෂය**

පැරණි සංචාරක ආඛ්‍යානයක් වන ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන කෘතිය සියම් දේශයට උපසම්පදාව ගෙන ඒම සඳහා ගිය දූත ගමන තේමා වී ඇත. එහෙත් නූතන සංචාරකාඛ්‍යාන සඳහා එක් රටක් තේමා වුවද එම රටෙහි විවිධ ස්ථාන නැරඹීමට ගොස් ලියූ වාර්තා ඇතුළත් වේ. හුලං හොරු කෘතිය සැලකීමේදී එය ශ්‍රී ලංකාව පදනම් වුව ද ශ්‍රී ලංකාව පුරා පුරා විසිරුණු ස්ථාන රැසක් විස්තර කරයි. අවාරයේ මීමුරේ ගියා වගේ, හුළං හොරු හා පරවි දූවට ආදී ලෙසින් ඒවා දැක්විය හැකිය. නීල් විජේරත්නගේ කෘතිවලද ඉන්දීය සමාජය තේමා කරගනිමින් ඉන්දියාවේ නගර බොහොමයක සංචාරය කොට ලියූ ලිපි දැක්වේ.

ඉහතදී සාකච්ඡා කළ සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ පැරණි හා නූතන සිංහල සංචාරකාඛ්‍යාන අතර වෙනස්කම් රාශියක් දැකිය හැකිය.

## 3. නිගමන සහ නිර්දේශ

ලාංකේය සංචාරක සාහිත්‍යයේ මුල් කාලීන සටහන් සියල්ලම පාහේ ලියවී ඇත්තේ සිංහල නොවන වෙනත් භාෂාවලිනි. එමෙන්ම සිංහල බසින් ලියවුණු සංචාරක ආඛ්‍යානවල ආරම්භය නිශ්චිතව දැක්විය නොහැකිය. නමුත් පහළොස්වන සියවසෙන් පසුව ලංකාවේ සිංහල සංචාරක ආඛ්‍යාන රාශියක් ලියවී ඇත. ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන, කේරළ නළඟන, බෙංගාලි යෙහෙළිය ආදිය මෙන්ම තවත් පැරණි සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යාන රාශියකි. දේශීය සංචාරක ආඛ්‍යානවල දැකිය හැකි විශේෂ

ලක්ෂණයක් වනුයේ එම වාර්තාවල විස්තර කර ඇති රටවල තොරතුරු මධ්‍යස්ථව, සුභවාදී ආකාරයෙන් දැකීමයි. එසේම මුල් කාලීන සිංහල ගමන් විස්තර කෘති බොහෝමයක් ලියවී ඇත්තේ ඉන්දියානු සංචාර පිළිබඳවය. මෙම පර්යේෂණයේදී තේමාත්මක වශයෙන් මෙන්ම භාෂා භාවිතයේදී පැරණි සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල දැකිය හැකි විචල්‍යතා හඳුනා ගත හැකි විය. විශේෂයෙන් භාෂා භාවිතයේදී වාක්‍ය වින්‍යාසය, අක්ෂර වින්‍යාසය, වචන වින්‍යාසය හා අලංකාර භාවිතය යන කරුණු ඔස්සේ වෙනස්කම් හඳුනා ගත හැකි විය. පැරණි සංචාරක ආඛ්‍යාන භාෂාව තරමක් සංකීර්ණය. තේරුම් ගැනීමට අපහසුය. නූතන සංචාරක ආඛ්‍යානවල භාෂා රටාව ඊට සාපේක්ෂව සරලය. තේරුම් ගැනීමට පහසුය. එම වෙනස්කම්වලට අමතරව සාම්‍යතාද හඳුනාගත හැකි විය. විදේශීය රටවල් හා ඒවායේ වෙසෙන්නන් පිළිබඳ අදහස් දැක්වීම (මේවායේ පුද්ගලයන් විවිධ රටවල් හෝ ප්‍රදේශ වෙත යෑමෙන් ලද අත්දැකීම් සංගෘහිතය.) සහ අතිශෝක්ති වර්ණනය පැරණි සහ නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයකි. පැරණි හා නූතන සිංහල සංචාරක ආඛ්‍යානවල විචල්‍යතා පැවතියද ඇතැම් තැනක සාම්‍යතා ලක්ෂණද ප්‍රකට වන බව නිගමනය කළ හැකිය. සංචාරක ආඛ්‍යාන අතර විචල්‍යතා ඇති වීම කෙරෙහි සමාජ පරිණාමය මෙන්ම භාෂා පරිණාමයද ප්‍රබල හේතුවක් වී ඇත.

## 4. ආශ්‍රිත ග්‍රන්ථ


පඤ්ඤාලෝක හිමි, වීගොඩ. (1998). *ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තනාපති ගමන*. කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේතුංග, හරිශ්චන්ද්‍ර. (2005). *ගුණසේන මහා සිංහල අකාරාදිය*. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සමාගම.

විජේරත්න, නීල්. (2008). *කේරළ නළඟන*. කොළඹ 10: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විජේරත්න, නීල්. (2005). *බෙංගාලි යෙහෙළිය*. පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

විජේරත්න, නීල්. (2011). *සංචාරක කතා සාහිත්‍ය : සනිදර්ශන සටහනක්,* සාහිත්‍යය (සංස්.) සමන්ත හේරත් සහ තවත් අය, සඳහන් නොවේ: සාහිත්‍ය අනුමණ්ඩලය.

වීරසිංහ, එස්. පී. එස්. (සඳහන් නොවේ). *හුළං හොරු*. නිට්ටඹුව: රන්මුතු ප්‍රකාශන.